GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2015.11.09

**මාධ්‍ය නිවේදනය**

**ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA), සීපා ගිවිසුම (CEPA) සහ ශ්‍රී ලංකිකයන්ගේ අනාගතය.**

ලෝකය තුළ පවතින වෙළඳ ගිවිසුම් ඒකපාර්ශවික, ද්විපාර්ශවික හා බහු පාර්ශවික ලෙස වර්ගීකරණය කළ හැක. ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA) සහ සීපා ගිවිසුම (CEPA) ද්විපාර්ශවික ක්‍රමවේදයට අයත් ගිවිසුම් වර්ග වේ.

වෙළඳ ගිවිසුමකදී වෙළඳාමේ යෙදෙන්නේ මොනවාද?

1. භාණ්ඩ වෙළදාම
2. සේවා වෙළදාම

ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA) සහ සීපා ගිවිසුම (CEPA) යන ගිවිසුම් මගින් භාණ්ඩ සහ සේවා දෙවර්ගයම වෙළදාමට ලක් වේ. වෙනත් රටවල ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් තම රටට අවාසියක් නොවන, රටේ ජනතාවට වාසි වන ජාතික ප්‍රතිපත්ති ඇත. නමුත් ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් එවැනි ප්‍රතිපත්තියක් නැත. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර දැනට ඇති නිදහස් වෙළඳ ගිවිසුමේ දත්ත පරීක්ෂා කර බැලුවිට එය ලංකාවට අවාසිදායක බව පැහැදිලිය.

මෙම දත්ත ලබාගත හැකි මූලාශ්‍ර

1. මහ බැංකු වාර්තාව
2. ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය/ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු වාර්තා
3. විදේශ සේවා නියුක්ති කාර්යංශයේ වෙබ් අඩවිය
4. Trading Economic නිල වෙබ් අඩවිය

ETCA සහ CEPA වැනි ගිවිසුම් වලදී සේවා වෙළදාම පමණක් නොව රටවල් අතර පුද්ගල නිදහස් සංක්‍රමණයටද ඉඩ සැලසේ. එලෙස ලංකාවට පැමිණෙන ඉන්දියානුවන්ට, ශ්‍රී ලාංකිකයන් ලෙස අපට ඇති සමාන අයිතිවාසිකම්ද ලැබෙනු ඇත. එහි තවත් අවාසියක් නම් එලෙස පැමිණෙන ඉන්දියානුවන්ගේ පවුල්වල සාමාජිකයන්ටද මෙරට පුරවැසියන්ට මෙන් සමාන හිමිකම් ලැබීමයි. එය භයානක බව අමුතුවෙන් කිවයුතු නැත.

**ඉන්දියාව සමග ඇති කර ගන්නා ද්විපාර්ශවික ගිවිසුම මගින් තරඟකාරීත්වයක් ඇති කර රට තුල පවතින සේවා දියුණු කළ හැකිද?**

ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වන තත්ත්වය යටතේ ඉන්දියාව සමග ඇති කර ගන්නා මෙවන් ගිවිසුම් තුලින් සේවා අතර සැබෑ තරඟකාරීත්වයක් ඇති කල නොහැක. උදාහරණයක් වශයෙන් වසරකට ශ්‍රී ලංකාවේ ඉංජිනේරුවන් 2000ක් බිහිකරන කරන විට ඉන්දියාව ඉංජිනේරුවන් ලක්ෂ 15ක් පමණ බිහිකරයි.

එබැවින් මෙම ක්‍රමවේදය මගින් සමතුලිත තරඟයක් ඇතිවනවා වෙනුවට වෛද්‍ය, ඉංජිනේරු, ගුරුවරු, කාර්මික ශිල්පීන් වැනි සියළු විද්වත් ක්ෂේත්‍ර ගිල ගැනීමකට භාජනය විය හැක. තවද ආර්ථික, සාමාජීය හා සෞඛ්‍ය දර්ශක වලින් ඉහල මට්ටමක පවතින රටක් ලෙස ලංකාව ඉන්දියානුවන් සමග තරඟකිරීමේදී සේවාවල පවතින ගුණාත්මකභාවය අඩුමිල වෙනුවෙන් පිරිහීමකට ලක්විය හැක.

ඉන්දියාව තුළ බොහෝ ක්ෂේත්‍රවල ලංකාවේ මෙන් සමානාත්මතාවය හා සමාජ සාධාරණය ඉතා අසතුටුදායක බැවින් මානව සම්පත් හුවමාරුවේ ප්‍රමිතිකරණය ලගා කරගැනීම ප්‍රායෝගිකව අපහසු වනු ඇත.

**මෙම ගිවිසුම සම්බන්ධයෙන් වගකීම දරන්නේ කවුද?**

මෙම ගිවිසුම් සම්බන්ධයෙන් වගකීම දරන ශ්‍රී ලංකාවේ වෙළඳ අමාත්‍යාංශයේ නිලධාරීන් කිහිපදෙනාටත් ඔවුන්ට උපදේශන සලසන ආර්ථික විශේෂඥයන් යැයි කියන නිලධාරීන් කිහිපදෙනාටත් සාර්ථකත්වයට පත්වූ ගිවිසුම් සකස් කිරීම සම්බන්ධයෙන් ඉතිහාස අත්දැකීම් නොමැත. එමෙන්ම ඔවුන් එවැනි ගිවිසුම් සැකසීම සම්බන්ධයෙන් සුදුසුකම් හෝ පිළිගැනීමක් නැති පිරිසකි.

ඔවුන් මෙවැනි ගිවිසුම් මඟින් ලංකාවට වාසියක් අත්වනු ඇතැයි පවසන පිරිසකි. ඔවුනට ඒ සඳහා පුද්ගලික අත්දැකීම් නැතත් එය පිළිබඳ අවංකව සිතනවා හෝ සිහින දකිනවා විය හැකිය. එසේත් නැතිනම් ඔවුන් කාගේ හෝ මුදලකට යටවූ පිරිසක් විය හැක. ඒ කෙසේ වෙතත්, මෙම පිරිස යෝජනාව පිළිබඳ ප්‍රතිපත්ති රාමුව, වෙළඳ  ගිවිසුමේ හා හුවමාරුවේ අනෙකුත් දත්ත කිසිඳු කෙනෙකුට ලබා නොදී සඟවන  පිරිසකි. මෙම කෙටුම් පත් කිසිවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුවත් සතුව නැත. නමුත් ඔවුන් ඉන්දියානු රජයට ලබාදුන් සමහර පත්‍රිකා නිල නොවන මට්ටමින් විද්වතුන් අතර සංසරණය වෙමින් පවතී.

මෙවන් රටේ ඉරණම තීරණය කරන ලේඛන පිළිබඳ තම දැනුම් තේරුම් මද බව තේරුම් නොගෙන, විද්වතුන්ගේ අවවාද පිළිනොගෙන, මෙලෙස සඟවා ගනිමින් කටයුතු කරන පිරිසගේ ක්‍රියාකලාපය තුලින් රටේ අනාගත ඉරණමට බලපාන මෙවන් ගිවිසුම් අත්සන් කලහොත් එයින් ඉවත්වීම ලංකාවේ උසාවි පද්ධතිය හෝ නීතිය තුලින් සිදු කළ නොහැක. එය බේරුම්කරණය කිරීමට ජාත්‍යන්තර මට්ටමට යායුතුය. එවන් බේරුම්කරණයන් සඳහා විශාල තාක්ෂණික හා නීතිමය දැනුම් සම්භාරයක් අවශ්‍යවේ. රටේ අයවැය මෙන් කිහිප ගුණයක මුදලක් මේ සඳහා වැය කිරීමට සිදුවිය හැක. එබැවින් එය ඉතා භායානක ප්‍රවණතාවයකි.

“හේජින්” ගණුදෙනුව පිළිබඳව සාකච්ඡා කිරීමට ක්‍රීඩකයෙක් ලංකාවේ නියෝජිතයා ලෙස යෙදීම නිසා රටට සිදුවූ පාඩුව කවුරුත් දනී. ජාත්‍යන්තර බේරුම්කරණය යන්න ලංකාවේ උසාවි වපසරියට යටත් නොවන නිසා ජාත්‍යන්තර බේරුම්කරණයේදී ලංකාවට විශාල මුදලක් ගෙවීමට සිදුවිය. එම මුදල ගෙවනුයේ බේරුම්කරණය සඳහා යෙදවූ අදාල ක්‍රීඩකයා නොව පුරවරුසියන් වන අපය. එලෙසම FTA/CEPA/ETCA වැනි ගිවිසුම් බේරුම්කරණයට මුදල් ගෙවීමට රට උකස් කිරීමට සිදු වනු ඇත.

මෙම කරුණු මෙතරම් ගැඹුරට තේරුම් නොගත් අප රටේ දේශපාලනඥයින් දිනෙන් දින  විවිධ පරස් පර මත පලකරමින්, ගිවිසුම් වල නම් ආකරශණීය ලෙස දිනෙන් දින වෙනස් කරමින් ජනතාව අතරින් විරෝධය පළවීම වැළැක්වීමට පියවර ගනිමින් සිටියි.

නමුත් බැලු බැල්මට මහජන නියෝජිතයන් කරුණු අධ්‍යනය කර රටට ආදරයෙන් වගකීමෙන් යුක්තව ක්‍රියා කරණ අයුරු දක්නට නැත. එබැවින් අප ඉල්ලා සිටින්නේ මෙම ගිවිසුම් වල පිටපත් රට වැසියනට අධ්‍යනය කිරීම සඳහා හෙළිදරව් කරන ලෙසයි.

ස්තුතියි.

වෛද්‍ය නලින්ද හේරත්,
ලේකම්.

වැඩි දුර විස්තර :- වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය හරිත අලුත්ගේ - 0718121619